සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** (1) සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ථේරවාදී බුදු දහම පිළිබඳ පුහුණු පාඨමාලා ආරම්භ කිරීම, පවත්වා ගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම තුළින් බෞද්ධ ජනතාවගේ සහ එම දරුවන්ගේ දහම් අධ්‍යාපනය, දැනුම, ආකල්ප, කුසලතා වැඩි දියුණු කිරීම සඳහා අතහිත දීම;

(ආ) බහුවාර්ගික හා බහු ආගමිකයින් ජීවත් වන ප්‍රදේශයක් වන බැවින්, එම ජාතීන් හා ආගමිකයින් අතර සුහදත්වය, හොඳහිත, සාමය, අවබෝධය හා සහයෝගීතාවය ඇති කිරීම තුළින් ඔවුනොවුන් අතර සංහිඳියාව වඩා වර්ධනය කර ගැනීම සඳහා කටයුතු කිරීම;

(ඇ) ප්‍රධාන ගුවන් තොටුපලට ආසන්නව නිස්කලංක පහසුකම් සපිරි බෞද්ධ ආගමික සිද්ධස්ථානයක් වන බැවින්, බෞද්ධාගමට සම්බන්ධ දේශන, සම්මේලන, සාකච්ඡා හා ඒ හා සම්බන්ධ වැඩසටහන් බෞද්ධ දර්ශන ඇසුරින් එකී දර්ශනයේ සහ සංස්කෘතිය වැඩිදුරටත් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දේශීය හා විදේශීය විද්වතුන්, බැතිමතුන් හා අනුගාමිකයින් කැඳවා ගැනීම, පහසුකම් සැපයීම ආදී ඒ හා සම්බන්ධ ක්‍රියාකාරකම්වලට ප්‍රමුඛත්වයක් දීමට කටයුතු කිරීම;

(ඈ) ශීල ව්‍යාපාර, භාවනා වැඩසටහන්, බෝධි පූජා ඇතුළු ආගමික වැඩසටහන් සංවිධානය කිරීම, මෙහෙයවීම හා ක්‍රියාත්මක කිරීම තුළින් දැහැමි සමාජයක් ගොඩනැගීම;

(ඉ) ශාසනික හා ජාතික විපත් හඳුනා ගනිමින් ඒවා පිටුදැකීමට සුදුසු පියවර ගැනීම;

(ඊ) ගිහි පැවිදි දෙපක්ෂයේම දේශීය හා විදේශීය ධර්ම දූතයන් පුහුණු කිරීම; සහ

(උ) ඉහත සඳහන් පරමාර්ථ හෝ ඉන් කීපයක් හෝ මුදුන් පමුණුවා ගැනීමට අවශ්‍ය, හිතකර හෝ ආනුෂංගික හෝ විය හැකි වෙනත් සියලු දේ කිරීම.

